**සමෘද්ධි අරමුදල - 2020**

**-----------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සමෘද්ධි අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වා ගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ආදායම් ගිණුම් 3 ක ශේෂවල එකතුව රු.15,360,370 ක් තහවුරු කර ගැනීම සඳහා අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | මේ සම්බන්ධව උපලේඛන හා ශේෂ සනාථ කිරීම් එවීමට කටයුතු කරන ලෙස ජීවනෝපාය අංශය දිස්ත්‍රික් වෙත ලිඛිතව දැනුම් දී ඇත. | අදාළ උපලේඛන හා ශේෂ සනාථ කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 876(3) | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර, දිවිනැගුම (සමෘද්ධි) සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය පිළිබඳ සමාලෝචනය කර නොතිබුණි. | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන දිනට යම් යම් අරමුණු හා පරමාර්ථ සාධනය කර ගැනීම සඳහා පවත්වා ගෙන එනු ලැබූ අරමුදල් සහ භාර අරමුදල් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේම ඒ ආකාරයෙන්ම පවත්වාගත යුතු බවට විධාන කර ඇත. | චක්‍රලේඛ හා විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.142,083,722 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 181,140,976 විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.39,057,254 පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කර ගෙන සමෘද්ධි අධිකාරිය විසින් නැවත අයකිරීමේ පදනම මත කෘෂි, ධීවර හා සත්ව පාලන වැනි ජීවනෝපාය ව්‍යාපෘති සඳහා සමෘද්ධි ප්‍රතිලාභීන් වෙත චක්‍රීය පදනම මත ණය ලබාදී තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණය එකතුව රු. 15,348,370 ක් විය. නිකුත් කළ ණය මුදල් ආපසු අයකිරීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින “ගම් පුබුදු ජීවනෝපාය චක්‍රීය” ගිණුමට බැර කරන ලෙස 2007 ජූලි 16 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උපදෙස් ලබාදී තිබුණි. නමුත් ණය ආපසු අයකර ගෙන ඇති බවට ලිඛිත සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | වාර්තා ඉදිරිපත් නොවුවද 2007 වර්ෂයට පෙර ලැබිය යුතු මුදල් සුළු ප්‍රමාණයන් වරින් වර ණය පියවීම සඳහා ලැබෙමින් පවතී. 2018,2019 හා 2020 වර්ෂ තුල රු. 1,472,051 ක් ලැබී ඇත. | භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා ලබා දී ඇති වැය මුදල් ආපසු ලබා ගැනීම පිළිබඳව විධිමත් හා ලිඛිත සාක්ෂි තබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2014 වර්ෂයේදී ප්‍රථම වරට අරමුදල වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අරමුදලේ පරමාර්ථ ලෙස ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති ගොඩනැගීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සම්පාදනය කිරීම දක්වා තිබුණු අතර අරමුදලේ කාර්යයන් ලෙස දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති වලින් ගොඩනැගිලි කුලී ගෙන්වා ගැනීම, එකී බැංකු/ බැංකු සමිති ගොඩනැගිලි නඩත්තු කිරීමට, නවීකරණයට හා නව ගොඩනැගිලි ආරම්භ කිරීමට භාණ්ඩාගාර ප්‍රතිපාදනවලින් බැහැරව අවශ්‍ය මූල්‍ය දායකත්වය සැලසීම දක්වා තිබුණි. එම අරමුණට හා කාර්යභාරයට අනුකූල නොවන ලෙස සමෘද්ධි අරමුදලට එතෙක් බැරකරන ලද ගොඩනැගිලි කුලී, සමෘද්ධි අරමුදලට බැර නොකරන ලෙසත් 2017 වර්ෂයේ සිට සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති විසින් එම මුදල් තමාගේම “බැංකු ගොඩනැගිලි සංවර්ධන හා නඩත්තු අරමුදල් ගිණුමට” බැර කරන ලෙසත් | මේ සම්බන්ධව 2017/7 චක්‍රලේඛයේ බැංකු ගොඩනැගිලි සංවර්ධන හා නඩත්තු අරමුදල් ගිණුම ලෙස මෙම අරමුදලේ අරමුණු සහ ඒ සඳහා ගෙවීම් කරන ආකාරය පැහැදිලි කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කළමනාකරණ මණ්ඩල අනුමැතියද මේ සඳහා ලැබී ඇත. | අරමුදල පිහිටුවීමේ පරමාර්ථ හා කාර්යයන් වෙනස් කිරීමේදී ව්‍යවස්ථාපිතව සිදු කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 2017 ජුනි 09 දින සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛයක් මගින් උපදෙස් ලබාදී තිබුණි. එවැනි උපදෙසක් ලබාදී තිබීම හේතුවෙන් ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති 1,286 කින් 2019 හා 2020 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතු කුලී ආදායම රු.30,864,000 ක් අරමුදල වෙත ලැබී නොතිබුණි. | | |
| (ඇ) | මහා භාණ්ඩාගාරයෙන් නැවත ප්‍රතිපූරණය කරගත හැකිය යන පදනම මත 2014 වර්ෂයේදී දැයට කිරුළ වැඩ සටහනට සමගාමීව දිස්ත්‍රික්ක 03 ක සංවර්ධන කටයුතු වෙනුවෙන් රු.212,000,000 ක ණය මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අරමුදලෙන් ලබාදී තිබුණි. නමුත් මහා භාණ්ඩාගාරයෙන් ලිඛිත අනුමැතියක් ලබාදී නොමැති බැවින් මෙම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට හැකියාවක් නොමැති බව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් 2018 ජනවාරි 02 දිනැතිව එවා තිබුණු ලිපියෙන් දන්වා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබාදීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව සිදු කල යුතුයි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 877(2)(ඇ) අනුව ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වර්ෂ 01 මාස 06 ක ප්‍රමාදයකින් පසුව 2022 සැප්තැම්බර් 16 දින ඉදිරිපත් කර තිබුණි. | ඔබේ අංක EHA/S/SDD/Funds/64 හා 2019.05.31 දිනැති ලිපියට අනුව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව කටයුතු කිරීම. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

### 4.2 අයවැයපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදය මගින් ස්ථාපිත කර තිබුණු මුදල් රෙගුලාසි 877(1) ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මෙම අරමුදල සමාලෝචනය කර මහා භාණ්ඩාගාරය විසින් ඉදිරියේදී ගනු ලබන තීරණයක් මත ව්‍යාවස්ථාපිත අරමුදල් ලෙස ස්ථාපිත කිරීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |